ලෝකයාට බම්බු ගසා ගන්නට කියා මුතුමුදලිගේ නිශ්ශංක ගේ ත්‍රිත්ව ට මා ආදරය කරමි.

- Mashi Hemapala

සමාජය තුල මිනිස්සු කතා කරන්න, ලියන්න බය වෙන මාතෘකාවක්.

- Indu Subashini

ඉතිං ඔබත් කියවලා නැත්නම් කියවන්න. යශෝගෙයි ෆෙයිත්ගෙයි ආදරය. ඔබටත් හිතේවි අපි සමාජයක් වශයෙන් ඔවුන් කෙරෙහි සානුකම්පිත විය යුතු බව.

- Gimhani Sankalpana

ත්‍රිත්ව series එක මට නම් කෙටියෙන්ම පිස්සුවක්.

- Nims Samarasinghe

Lesbian කතාවක් කියන රාමුවෙන් එලියට ඇවිත් විවෘත මනසකින් මේ පොත කියෙව්වොත් මිනිසාට විවිධාකාර හැඟීම්, ක්‍රියාකාරකම් හරි අපූරුවට පුලුල් මනසකින් දකින්න පුලුවන්.

- Maneesha Shashendri Amarasinghe

ත්‍රිත්ව, වීනස්, බේබි මේ පොත් තුන නම් පිස්සුවක් ❤

- Harinda Fernando

ඉතාමත් පහසුවෙන් රස විදීමට හැකි භාෂා ශෛලියකින් රචිත මෙම කෘතිය ඔහුගේ අනෙකුත් නිර්මාණ මෙන්ම රසවත් වන අතරම වෙනස් කොණයකින් සමාජය තුල ජීවත් වන විවිධ වූ මිනිසුන් පිළිබඳ කෙරෙන විග්‍රහයකි.

- Lahiru Jayarathna

ආදරය යනු ආදරයමය. ආදරයට කිසිදු භේදයක් නැත. ආගමට කිසිදු ජාතියක්, භාෂාවක් නැත.

- Katapatha

ඇත්තෙන්ම මෙම කථාව අපූරුය. මුතුමුදලිගේට හුරු වේගවත් ශෛලියෙන් ලියා ඇති කථාව එක හුස්මට කියවාගෙන යා හැකි තරම් වූ රසවත් භාෂා රටාවකින් ලියැවී ඇත.

- Manjula Wijesinghe

ත්‍රිත්ව කියවූවෙමි... නැත පිස්සුවෙන් මෙන් කිය වූවෙමි.. නොනැවතී කිය වූවෙමි... පැය 24ක් ඇතුලත කියවා නිමකළෙමි.

- Shani Thomaz

ත්‍රිත්ව (අදටත් මගෙ ආසම පොත).

- Hansi Abeywardhana

පොත කියවලා මම ඉක්මනට මගේ මහත්තයාට කතා කරා. මම කිවුවේ මෙච්චරයි. 'ඔව් මං දැන් ඒ හැඟීමත් දන්නවා.'

- Binu Pathirana

අසම්මතයක සම්මතයක් සොයා ගිය ප්‍රේමවන්තියක් දෙදෙනෙක්.

- Lochani Amarasooriya

වටිනා සමාජ පණිවිඩයක් ලබා දෙන නිර්මාණයක රස පහස විඳ ගැනීමට ' ත්‍රිත්ව' රස විඳිය යුතුම ය. එය තවත් එක් නිර්මාණයක් පමණක් නොවේ, සමාජයේ ප්‍රගමනයට අනෙකාගේ ලිංගිකත්වය, ගැරහීම හෝ හෙළා දැකීම කළ යුතු නොවන බව කියා දෙන අපූරු කතාවකි.

- Dhananjani Kariyawasam

මම මේ තාක් කියවපු පොත්වලින් පළවෙනිම සමලිංගික ශානරයෙ පොත මේක. කෙටියෙන්ම කියනවානම් 'ත්‍රිත්ව' අති විශිෂ්ඨයි.

- J Ma Sh

පොත කියවාගෙන යද්දී එය බිම තබන්නට බැරි බවක් දැනෙන්නේ ම එහි ගුණාත්මකභවය නිසාමැයි. මුතුමුදලිගේ නිශ්ශංක මහතාගේ පොත් වලටද මා ඇබ්බැහි වී ඇත්තේ ඔහුගේ වචනතුල ඇති, නිදහස්භාවයත් ගලායන ස්වරූපයත් නිසාමැයි.

- Sugala Kumari

එක දිගට කියවන්නට තරම් කුතුහලය පිරි රසවත් කතාවක්.

- Shakila Rushen Ludowyke

කුතුහලය, ශෘංගාරය රැගත් මේ පොත එක හුස්ම ට කියවා අවසන් කලෙමි. ත්‍රිත්ව වෙනස්ම අත්දැකීමකි.

- Nishamini Silva

"ත්‍රිත්ව", ඔව් ඒක ඇත්තටම වෙනස් පොතක්. ඇයි ඒ..? මොකද කිව්වොත් මම හිතනවා ඔයා, මම, මේ අපි හැමෝගෙම හිතේ 'යශෝධා, ෆෙයිත්, මාවෙලෝ' කියන චරිත අඩු වැඩි වශයෙන් ජීවත් වෙනවා කියන එක.

- Shirlin Poornima

ත්‍රිත්ව

Faith

පොත්මී ප්‍රකාශන මුද්‍රණ
7 වන මුද්‍රණය - 2024 අගෝස්තු

ISBN 978-624-5552-20-7
මුද්‍රණය - එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො 27/18 ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.

සෝදුපත් පරීක්ෂාව - අශෝක කුලතුංග
කවර නිර්මාණය - ප්‍රදීප් ප්‍රේමලාල්
පිටු සැකසුම - කාවින්ද්‍යා රත්නායක

මෙම පොතෙහි සියලුම හිමිකම් ඇවිරිණි. කර්තෘගේ අවසරය නිසි පරිදි ලිපියකින් නොලබා මෙහි එන කිසිවක්ම, මොනම ආකාරයකින්වත් නැවත පළ කිරීම තහනම් වේ. එම තහනමට: අතින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, වීඩියෝ හෝ ඕඩියෝ ලෙස නිර්මාණය කිරීම,

ඊ -බුක්, PDF ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුළත් බව සලකන්න.

Copyright @ Muthumudalige Nissanka

සියලුම හිමිකම් ඇවිරිණි.

මුතුමුදලිගේ නිශ්ශංක 2024

පොත්මී ප්‍රකාශනයක්

ෆේයිත් "ත්‍රිත්ව" ඔයාට,

ඔයා ගැන ඇතිවෙච්ච ඒ සුන්දර ආදරයට

Faith' B'

This book is for you!

මා ඔබට පවසන්නට යන මේ කතාව ආරම්භ කිරීමට මත්තෙන් 2018 වර්ෂයේ බර්න් නුවර "සොලිකොෆෙන්" නමින් හඳුන්වන කුඩා ගම්මානයක් තුළ සිදුවූ සිදුවීමක් ඔබ දැනගත යුතු ය.

මා ඉහත සඳහන් කළ වර්ෂයේ දී "සොලිකොෆෙන්" ගම් සීමා මායිමේ සිදුවූ හදීසි අනතුරකින් පුද්ගලයකු ජීවිතක්ෂයට පත් වී තිබිණ. ඊට පසුදින "බර්න් ඩේලි මේල්" පුවත්පත එම සිද්ධිය පහත ආකාරයෙන් වාර්තා කොට ඇත.

"ඊයේ රාත්‍රියේ දි සොලිකොෆෙන්හි දී සිදුවූ මෝටර් රථ අනතුරින් පුද්ගලයකු ජීවිතක්ෂයට පත් වී ඇති අතර සොලිකොෆෙන් කඳුකර මාර්ගයේ දී වේගයෙන් ධාවනය වී ඇති "ලා ෆෙරාරී" වර්ගයේ k65567 දරන මෝටර් රථයේ වේගය පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැනීම නිසා මෙම අනතුර සිදුවී ඇතැයි පොලිස් නිල නිවේදනය සඳහන් කරයි.

මෙම අනතුරින් ඉතාලී ජාතික "ඇලෙක්සැන්ඩ්‍රියා මාචෙලෝ' යන අයකු මියගොස් ඇති අතර බර්න් අපරාධ විමර්ශන ඒකකය මෙම අනතුර පිළිබඳව තවමත් පරීක්ෂණ කරමින් පවතී"

ස්විස්ටර්ලන්ත "හදීසි අනතුරු" නීතියේ I\A76 - උප වගන්ති 84 යන කොටසෙහි සඳහන් වන පරිදි මාර්ගයේ දී සිදුවූ හදීසි අනතුරක දී සිදුවන මරණයක් පිළිබඳ පූර්ණ විමර්ශන වාර්තාවක් දින 7ක් ඇතුළත, අනතුර සිදුවූ ප්‍රදේශයෙහි පොලිස් විමර්ශන ඒකකය විසින් උසාවිය වෙත ඉදිරිපත් කළ යුතු අතර, එම වාර්තාවලට අනුව සිදුවී ඇති මරණය 'හදිසි අනතුරකින් සිදූවු' මරණයක් බවට උසාවිය විසින් තහවුරු කළ පසුව එය නිෂ්ප්‍රභා කර දමනු ඇත.

බර්න් විශේෂ විමර්ශන ඒකකය මෙම සිදුවීම හඹා යෑමත්, අදාළ සම්පූර්ණ වාර්තාව දින 7ක් ඇතුළත උසාවියට ඉදිරිපත් කිරීමත්, යන වගකීම් එම දෙපාර්තුමේන්තුවේ ම නිලධාරිනියක වූ "ලුසී සිරෝබ්‍යාන්"ට පැවරුවා ය.

ත්‍රිත්ව - මෙයින් ආරම්භ වෙයි.

ත්‍රිත්ව, 2018 වර්ෂයේ දී ස්විස්ටර්ලන්තයේ දී සිදුවූ සත්‍ය සිදුවීම් දාමයක් මූලාශ්‍ර කරමින් නිර්මාණය කෙරිණ.

ආරම්භය

සොලිකොෆෙන්හි "හස්ටන් මාවතෙහි" අංක විසි දෙක දරණ නිවස ඉදිරියෙහි මිනී කුපරය නැවැත්වූ ලුසී ඇය අතෙහි වූ ෆයිල් කවරය පෙරළමින් එහි වාර්තා අතර තිබුණු නම කියැවූවා ය.

"මෙය ඉන්දියානු නමක් විය යුතු ය" ඇය එහි වූ දත්ත අතරට දෙනෙත් හෙළී ය.

"යශෝධා විමලසූරිය,

වයස අවුරුදු 27යි.

ශ්‍රී ලාංකික,

ද්විත්ව පුර්වැසි - "ස්විස්ටර්ලන්තය"

"මම්ම්, ශ්‍රී ලාංකික" ඇය සෙමෙන් තමාට ම මුමුනා ගත්තා ය. ෆයිල් කවරය වසා දැමූ ඇය සුක්කානමට ඉහළින් ඇති උඩු දර්පණයෙන් පෙනෙන තම රූපය දෙස බැලුවා ය. එය දැකීමෙන් ඇයගේ දෙනෙතට ආලෝකයකුත්, දෙතොලට සියුම් සිනහවකුත් නැගිණ. ඇයගේ දූ සිඟිත්තියගේ කුඩා පින්තූරයක් මෙම දර්පණය කොනෙහි අටවා ඇත. ඇය දෙතොලට අතක් තබා එයින් මුදවා ගත් හාද්දක් එම ඡායාරූපය මත තැබුවා ය. ඉන්පසුව ෆයිල් කවරයත් සමඟ කාරයෙන් බැසගත් ඇය නිවෙස දෙසට එන්නට පටන් ගත්තා ය.

සොලිකොෆෙන්, ගිම්හාන කාලයට අපූරු සුන්දරත්වයක් මවන නගරයකි. ඇය නිවෙස දෙසට එද්දී උදෑසන සීතලත් සමඟ හමා ආ සුළඟක් ඇයගේ රන්වන් පැහැ හිසකෙස් සුළං රැල්ලත් සමඟ පා කර දැමීය. හිරු කිරණ අහස මුදුනට එමින් තිබුණෙන් එයින් නික්මුණු මනස්කාන්ත ආලෝකය නිවස වටා ඇති මල් ගස් අලංකෘත කරමින් ඇත. පරිසරයේ වූ දැඩි නිශ්ශබ්දතාවය අතරින් මල් ගස් වටා පියාඹන බඹරුන්ගේ පිහාටු එකිනෙක හැපෙන ගුම් නාදය ඇයගේ දෙසවනට ගලා ආවා ය. ඒ සියල්ල විඳිමින්, ඈ සෙමෙන් සෙමෙන් නිවසෙහි ප්‍රධාන දොර වෙතට පිය මැන්නා ය.

දොර අසලට පැමිණි පසුව ඇය යළිත් හැරී පිටුපස බැලුවා ය. නිවස

වටා වැටක ආකාරයෙන් නිල් සහ රතු මල් ගස් පාත්තියක් වවා ඇත. ඒවා ඇතුළත නිවසට පැමිණෙන මං තීරුව දෙපස මනාව කැපූ තණකොළ පාත්තියකි.

"පිළිවෙලවට ජීවත් වෙන්න පුරුදු වුණු කෙනෙක්"

ඒ දෙස බැලූ ලුසී ඇයට ම මුමුනා ගත්තා ය. ඉන්පසු දොර දෙසට හැරුණු ඇය එහි වූ සීනුව නාද කළා ය.

විනාඩි කිහිපයක් ගත විය. තරුණියක් විත් දොර විවර කළා ය.

"මිස් යශෝදා වික්‍ර...ම...සූරියා"

ලුසී තම අතේ වූ ෆයිල් කවරය දෙස බලමින් ගොත ගැසුවා ය. එය උපතින් ම ජර්මානුවකු වූ කාන්තාවකට උච්චාරණය කිරීමට අපහසු නමකි.

"ඔව්, යශෝදා වික්‍රමසූරිය"

නිවසේ සිටි තරුණිය සිනහවකුත් සමඟ පැවසුවා ය.

ලුසී ඇය දෙස මනා බැල්මක් හෙළී ය. ඇයට ඇත්තේ ලුසී හා සමාන ම උසකින් යුත් සිරුරකි.

'අඩි පහකුත් හතක් වෙන්න ඕනේ' ඇය දෙස බලද්දි ලුසී නිගමනය කළා ය. ඇය සිහින් ය. දිගු බෙල්ලකුත්, කළු කොටට කැපූ කොණ්ඩයකුත් ඇත. මුහුණ දිගැටි මුත් මඳ කවාකාර හැඩයකින් යුක්ත ය. කාල වර්ණ දෑසකුත්, පැහැපත් කහ පැහැති සමකුත් ඇයට ඇත. මේ මොහොතේ ඇය ස්නානයෙන් පසුව කාන්තාවන් අඳින්නා වූ දිගු ලා නිල් පැහැති තුවා ලෝගුවක් ඇඳ සිටියා ය.

"මම ලුසී සිරෝබ්‍යාන්, බර්න් අපරාද විමර්ශන ඒකකයෙන්, මම තමයි යශෝදාට අද උදේ කෝල් කළේ "

නිවසෙහි දොර අසල හිටගෙන සිටි තරුණියගේ මුවින් සිහින් සිනාවක් නික්මුණා ය. ඇය ඉතාමත් ප්‍රියමනාප මුහුණකින් යුක්තව මෙසේ පැවසුවා ය.

"එන්න ඇතුළට, මම මිසිස් ලුසීව බලාපොරොත්තුවෙන් හිටියේ"

නිවස තුළට පැමිණි ලුසී ඇය සෑම විට ම කරන්නාක් මෙන් ඇයගේ දෙනෙත් යන සෑම තැනක් දෙස ම මනා බැල්මක් හෙළුවා ය. එය මඳක් විශාල වූ සාලයකි. එහි එක් පැත්තක කළු පැහැ දිගු සෝපාවකුත්, එම සෝපාවට ඉදිරියෙන් එකිනෙකට සමාන්තරව තැබූ ඒ පැහැයෙන් ම යුත් කුඩා සෝපා දෙකකුත් ඇත. ඒවාට මැද්දෙන් ඇත්තේ වීදුරු ආවරණයක් සහිත ටියුපෝවකි. සාලයේ එහා පස කෙළවරෙහි කෑම මේසයකුත්, බිත්ති

වටා වූ ලී රාක්කවල පොත් සහ විසිතුරු දේවලුත් තබා ඇත. නිවසේ සාලයට ඇතුළතින් ඇති කොරිඩෝව නිදන කාමර සඳහා විය යුතු ය.

"ස්විස්ටර්ලන්තයට සංක්‍රමණය වූ බොහෝමයක් අයට මෙවැනි නිවසක් සිහිනයකි" ලුසී තමාට පෙනෙන දෑ දෙස බලමින් කල්පනා කළා ය.

"ඉඳගන්න ලුසී"

යශෝදා සාලයේ වූ සෝපාව පෙන්වමින් ඇයට පැවසුවා ය.

ලුසී එය කාරුණික සිනහවකුත් සමඟ පිළිගත්තා ය.

"යශෝදා, ස්විස්ටර්ලන්තයට ඇවිත් අවුරුදු දහයක්, මම හරි ද?"

"ඔව්..."

ලුසී ඇයගේ කොළ පැහැ දෙනෙත්වලින් නිවස වටා යළිත් බැල්මක් හෙළී ය.

"මේ නිවස, මිස් යශෝදට අයිති එකක් ද ?"

ඇය සෝපාවේ හිඳගන්නා ගමන් යශෝදාගෙන් ඇසුවා ය.

ලුසීගේ ප්‍රශ්නයට ඇය පිළිතුරු දුන්නේ නැත. ඒ වෙනුවට තම කපු ලෝගුව ඇඟට තද කරගත් යශෝදා සාලයේ අනෙත් කොනට යන්නට පටන් ගත්තා ය. සාලයේ එක් පැත්තක ඇති කෑම මේසයට ආසන්නව කොෆී සාදන යන්ත්‍රය තබා ඇත.

"මිසිස් ලුසී, කෝපි ද තේ ද ?"

"කොෆී යශෝදා, ඔයාට අපහසුවක් නැත්නම්"

ලුසී සිනහවකුත් සමඟ පැවසුවා ය.

යශෝදාගේ එම ප්‍රශ්නයෙන් ලුසී එක් දෙයක් දැනගත්තා ය.

"ඇය අසීරු කාන්තාවක් විය යුතු ය. එසේම බුද්ධිමත්, ඍජු කෙනෙකි" ඇයට තම රාජකාරී ජීවිතයේ දී මෙවැනි කාන්තාවන් අනන්තවත් හමුවී ඇත.

ටික මොහොතකින් යශෝදා කෝපි කෝප්ප දෙකකුත් සමඟ ලුසී හිඳගෙන සිටි සෝපාව අසලට පැමිණ එයින් එකක් ලුසීගේ අතට දුන්නා ය. ලුසී ඇයගේ සුපුරුදු සිනහවත් සමඟ එය පිළිගත්තා ය. යශෝදා ලුසී සිනහාසෙන විට ඇයගේ සිනහව දෙස ඍජු බැල්මක් හෙළී ය. ලුසීට ඇත්තේ කොළ පැහැ දෙනෙතකි. දිගටි මුහුණක් සහ එයට ම ගැළපෙන සුන්දර වූ සිනහවකි. ඇයගේ රන්වන් පැහැ කොටට කැපූ කොණ්ඩය කෝපි කෝප්පය ගැනීමට හිටගනිද්දී මුහුණට කඩා වැටුණෙන් ඇය එය සෙමෙන්

පසෙකට කරගත්තා ය.

"මිසිස් ලුසී" යශෝදා මිමිනුවා ය.

"ඔව් යශෝදා"

"ඔයා හිනාවෙනකොට ලස්සනයි!"

"මම්ම්" එය ලුසී බලාපොරොත්තු නොවූ දෙයකි. ඇය ලොකු කරගත් කොළ පැහැ දෙනෙතින් යශෝදා දෙස බැලුවා ය.

ඇයට කුමක් කියන්න දැයි ලුසීට තේරුණේ නැත. ඇය යශෝදාගේ නිවසට පැමිණියේ මිනිමැරුමක් ගැන කට උත්තරයක් ගැනීමට වුවත්, යශෝදා කිසියම් ආකාරයකින් ඇයව ග්‍රහණයට නතු කර ගැනීමට යන බැව් ඇයට වැටහිණ.

"ස්තුතියි යශෝදා" ඇය සෙමෙන් මුමුනමින් නිශ්ශබ්ද විය.

යශෝදා යළිත් ලුසී දෙස බැල්මක් හෙළා කෝපි කෝප්පය ද සමඟ සෝපාවෙන් හිඳගත්තා ය. ඇය ඇඳ සිටි කපු ලෝගුව, ඇය සෝපාවේ හිඳග න්නා විට මෑත් වුණෙන් එයින් ඇයගේ කලවා මනාව පෙනෙන්නට විය. ඇය එය ගණනකට ගත් බවක් පේන්නට නැත. තට්ටම තෙක් ලෝගුව ඇත් කළ ඈ කකුලක් පිට කකුලක් දැමුවා ය.

ලුසී ඇයගේ එළියට නෙරා පැමිණි කලවා දෙසත්, කපු ලෝගුවෙන් බාගෙට පෙණුනු පිරුණු පියයුරු දෙසත් බැල්මක් හෙළා, ඒ බැල්ම ඇයගේ මුහුණ දෙසට රැගෙන ගියා ය. කෝපි කෝප්පය දෙතොලට තබා ගනිමින් යශෝදා ඇයගේ කාල වර්ණ දෙනෙතින් ඈ දෙස එක හෙල්ලේ ම බලා සිටිනු ඇය දුටුවා ය.

ලුසී ඇයගේ දෙනෙත් දෙස බලා සිටිය දී ම තවත් ඍජු බැල්මකින් යශෝදා මෙසේ පැවසුවා ය.

"නැහැ ලුසී, මේ ගේ මගේ නෙමෙයි, මේක මගේ කෙල්ල කුලී පදනම මත අවුරුදු දෙකකට අරගත්ත එකක්. මේ ගෙදර කොන්ත්‍රාත්තුව ඉවරවෙන්න තව මාස හයක් තියෙනවා, එතකන් එයාට මේ නිවසේ ඉන්න පුළුවන්"

ඇයගේ ඍජු අවංක පිළිතුරින් ලුසී සෑහීමට පත් විය. හැරත් එය ඈ මීට පෙර දැන සිටි දෙයකි. නිවසෙහි ලිපිනයත් සමඟ අදාල දත්ත වාර්තා කියවන ඕනෑ ම නිලධාරියකුට එය වසර දෙකක කුලී පදනම මත "ෆෙයිත් බෙකර්" නම් අයකුට පවරා ඇති නිවසක් බවට සොයා ගැනීමට හැකිවනු ඇත.

"ඔයා දුන්නේ අවංක පිළිතුරක්, මම ඒ ගැන සතුටු වෙනවා"

ඇය එසේ පවසත් ම යශෝදාගේ මුවින් ඉතාමත් සියුම් සිනහවක් මතු වී ආවා ය. එම සිනහවත් සමඟ කොණ්ඩය මඳක් පසෙකට කර ටියුපෝව මත ඇති ෆයිල් කවරය දෙස බැලූ යශෝදා මෙසේ පැවසුවා ය.

"මම දන්නවා ලූසී ඒක දැනගෙන හිටියා කියලා, අපරාධ විමර්ශන ඒකකයට ඕනෑ ම පුද්ගලික වාර්තාවක් පරික්ෂා කරන්න අයිතිය තියෙනවා. මේ නිවස ගැනත් ෆෙයිත් ගැනත් සේරම විස්තර ඔබ ඔය මේසය මත තැබූ වාර්තාවෙ ම ඇති"

යශෝදාගේ එම පිළිතුරෙන් ලූසී පුදුම වූයේ නැත. යශෝදාගේ චරිතය ගැන ඈ කලින් සිතූ ආකාරය නිවැරදි ය.

ඇය බුද්ධිමත් ය, ඇයගේ දෙනෙත් සහ ඇය භාවිතා කරන වචන උපායශීලීත්වයෙන් අනූනය, හැඟීම් ප්‍රකාශ කිරීමේ දී ඇය භාවිතා කරන ඉරියව්වලින් සියුම් ලෙස කෙනකුව ආකර්ෂණය කිරීමේ හැකියාවක් ඇය සතු ය. ලූසී සිතූ ආකාරයට ම මෙවන් පුද්ගලයින්, විශේෂයෙන් ම මෙවැනි චරිත ලක්ෂණයන්ගෙන් යුත් කාන්තාවන් සමඟ අපරාදයක් පසුපස හඹා යෑම එතරම් පහසු කාර්යක් වන්නේ නැත.

ලූසී ද සිනහවකින් ම යශෝදාගේ නිගමනය නිවැරදි බවට ඉඟියක් කරමින් ඇයගේ අතේ වූ කෝපි කෝප්පය ටියුපෝව මත තැබුවා ය.

"මිස් යශෝදා, ඔයාගේ විරෝධයක් නැත්නම්, අපේ පරීක්ෂණ කටයුතුවලට පහසුවක් ලෙස ඔයාගේ කට උත්තරය රෙකෝඩ් කරගත්තට කමක් නැද්ද?"

තම කෝට් සාක්කුවේ තිබුණු සොනී රෙකෝඩරය අතට ගත් ලූසී එය යශෝදා ඉදිරියේ තිබුණු ටියුපෝවේ තබමින් ඇසුවා ය.

"ඒකට ප්‍රශ්නයක් නැහැ මිසිස් ලූසී" කී ඇය සාලයේ එහා කොනේ බිත්තියේ එල්වා තිබුණු ඔරලෝසුව දෙස බැලුයෙන්, රෙකෝඩරයේ රතු බටනය එබීමට කලින් ලූසී ඇයගෙන් මෙසේ ඇසීය.

"යශෝදා, මේ කට උත්තරයට විනාඩි කිහිපයක්, එහෙමත් නැත්නම් පැයක් වුණත් වැය වෙන්න පුළුවන්. ඔයාට ඒකට මේ මොහොතේ වෙලාවක් නැත්නම් අද දවස ඇතුළත ඔයාට සිද්ද වෙනවා සොලිකොෆෙන් පොලිස් ස්ථානයට ඇවිත් කට උත්තරය ලබා දෙන්න"

"නැහැ මිසිස් ලූසී, වෙලාව ප්‍රශ්නයක් නැහැ, මට පස්වරු එක වෙනකන් පැය තුනක කාලයක් තියෙනවා. දැන් වෙලාව දහය යි, පස්වරු දෙක වෙද්දි මම හොටෙල් එකේ ඉන්න ඕනේ"

"එහෙනම් පටන් ගමු ද?" කී ඇය යශෝදාගේ එළියට නිරාවරණය වී තිබුණු කපු පොරෝන සළුව දෙස බැලුවා ය.

"මිස් යශෝදට ඕනේ නම් වෙනත් පහසු ඇඳුමක් ඇඳගෙන එන්න පුළුවන්"

"නැහැ, මේක හොඳයි"

"හරි, එහෙනම් මම පටන් ගන්නවා" කී ලුසී රෙකෝඩරයේ රතු බටනය ඔබා ටියුපෝව උඩ වූ ෆයිල් කවරය ගෙන, එය විවෘත කොට මෙසේ පැවසුවා ය.

"දිනය 2018 අගෝස්තු 25,

කට උත්තර කරු - යශෝදා විමලසූරිය

පදිංචිය අංක 22 සොලිකොෆෙන්,

ශ්‍රී ලාංකික.

ද්විත්ව පුරවැසි ස්විස්ටර්ලන්තය,

පුරවැසි අංකය SW11998733"

"යශෝදා විමලසූරිය"

"ඔව් ලුසී"

"ඔයා ඇලෙක්සැන්ඩ්‍රෝ මාචෙලෝව අඳුරනව ද?"

"ඔව්"

"කොහොමද?"

"මාචෙලෝ, සොලිකොෆෙන්, ටියුලිප් හෝටලයේ ඩිරෙක්ටර්, මම වැඩ කළේ මාචෙලෝ යටතේ"

"ඔය දෙන්නා අතර තිබුණේ මොන වගේ සම්බන්ධයක් ද ?"

යශෝදාගේ මුවින් එම ප්‍රශ්නෙට සිනහවක් නැගිණ. එයට හේතුව ලුසී වටහා ගත්තා ය.

"මිස් යශෝදා, මට දැනගන්න ඕන වුණේ, මාචෙලෝ සහ ඔයා අතර තිබුණ සම්බන්ධය"

"මට සමාවෙන්න මිසිස් ලුසී"

යශෝදා ඒ වචනය පැහැදිලිව ම කියුවා ය.

ලුසී ඇයගේ දෙනෙත් දෙස එක එල්ලේ බැලුවා ය.

'සිනහව, සිතෙහි දෙගිඩියාවක් ඇති කිරීම සහ සමාව ගැනීම, මනෝ විද්‍යාවට අනුව කෙනකුගේ සිතක් ග්‍රහණය කර ගැනීමට හැකි පුරුක් තුනකි. ඇය ඉතාමත් හොඳින් එය කරමින් සිටී'. ලූසී සිතුවා ය.

"මම මාචෙලෝගේ සෙකට්රි, ඒක රාජකාරීමය සම්බන්ධයක්, ඒ හැරෙන්න වෙනත් පුද්ගලික සම්බන්ධයක් අපි අතර තිබුණේ නැහැ"

"මිස් යශෝදා දන්නවා ඇති, මාචෙලෝ මේ වෙනකොටත් ජීවතුන් අතර නැහැ"

"ඔව් මම ඒක දන්නවා"

"කොහොමද?"

"මාචෙලෝගේ අනතුර සිද්ද වුණු දවසට පහුවෙනිදා ම අපිට ඒක ආරංචි වුණා. මට විතරක් නෙමෙයි, හොටෙල් එකේ වැඩ කරපු හැමෝටම"

යශෝදා එය පවසත් ම ඇයගේ කට හඬ කෙමෙන් බයාදු වී ගියා ය. ඇයගේ දෙනෙත් කඳුලින් පිරී යන්නට විය. ඇය තත්පර කිහිපයක් බිම බලාගෙන සිටියා ය. ඒ තත්පර කිහිපය තුළ ලූසී නිශ්ශබ්දව ඇයව නිරීක්ෂණය කළා ය. පොලිස් නිලධාරිනියකට මෙය අනගි අවස්ථාවකි. මරණයකට පසුව කට උත්තරකරුවන් ඔහුගේ හැඟීම් ප්‍රකාශ කරන සෑම ආකාරයකින් ම මරණයට ලක් වූ තැනැත්තා සහ ඔහුන් අතර ඇති සම්බන්ධය වටහා ගත හැක. ඊටත් වඩා එවන් මොහොතක ඔවුන්ගේ හැසිරීම නිවැරදිව නිරීක්ෂණය කළහොත් එමගින් ඔවුන් සහ මරණය අතර සම්බන්ධයක් ඇත්දැයි පවා වටහා ගැනීමට හැකියාවක් ඇත.

එහෙත් මේ මොහොතේ දී යශෝදා තුළින් ගැඹුරු සාංකාවක් පහළ වූයේ නැත. ඇය පළ කළේ සාමාන්‍ය ආකාරයෙන් මරණයක් ගැන ඇසීමේ දී කාන්තාවක් දක්වන දුක්බර සංවේදීතාවය යි. ලූසීගේ නිගමනය අනුව යශෝදා දැඩි සිතක් ඇති කාන්තාවක් වූයෙන් ඇය එම වේදනාව පිටතට නොපෙනෙන ලෙස සඟවා සිටීමට වෙර දරනවාක් විය හැක.

ඊටත් වඩා, ලූසී ළඟ ඇති වාර්තාවලට අනුව මාචෙලෝ ටියුලිප් හෝටලයට පැමිණ ඇත්තේ අගෝස්තු මස 01 වෙනි දින වන අතර ඔහු මිය ගොස් ඇත්තේ මීට දවසකට පෙර එනම් අගෝස්තු මස 23 වන දින අලුයම් කාලයේ දී ය. මේ දවස් කිහිපය අතර ඇති පරතරය දෙස බැලූ කල එය රාජකාරීමය වශයෙන් සති තුනකට ආසන්න වූ ඉතාමත් කෙටි කාලයකි. මෙවන් කෙටි කාලයක දී මාචෙලෝ සහ යශෝදා අතර දැඩි සම්බන්ධයක් ඇති විය නොහැක. ඒ නිසා ම යශෝදාගේ දෑසින් මතුවූ සියුම් කනගාටුව ඇයට සාපේක්ෂව නිවැරදි විය හැක.

නිහඬව ටික මොහොතක් සිටි යශෝදා කෝපි කෝප්පය අතට ගෙන එයින් උගුරක් පානය කොට යළිත් ලුසී දෙස බැල්මක් හෙළුවා ය. ඇයගේ දෙනෙත් තුළ තවමත් කඳුළු රැඳී ඇත.

"සමාවෙන්න ලුසී" කී යශෝදා පුටුවේ ඍජුව හිඳගත්තා ය.

"ඒකට කමක් නැහැ" කී ලුසී යශෝදා දෙසට වඩාත් නැඹුරු විය. ඊළඟට ඇය අසන්නට යන ප්‍රශ්න තුළින් යශෝදා සහ මාචෙලෝ අතර තිබූ සම්බන්ධතාවය වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමේ අවශ්‍යතාවයක් ඇයට තිබිණ.

"හොටෙල් ටියුලිප් එකට එන්න කලින් මාචෙලෝව යශෝදට මුණගැහිලා තියෙනව ද?"

"නැහැ" යශෝදා එය ස්ථිරව ම කීවා ය.

"ඒ කියන්නේ ඔයා මාචෙලෝ යටතේ වැඩ කළේ සති තුනක් වගේ කෙටි කාලයක්?"

යශෝදා මොහොතක් කල්පනා කළා ය.

"ඔව්" ඇය පැවසුවා ය.

ලුසී ඇයගේ ෆයිල් කවරයේ වූ, දෙවැනි ලිපිය පෙරළුවා ය. එහි ඇය විසින් සටහන් කර තිබූ කරුණු මෙම පරීක්ෂණයට වඩාත් වැදගත් වූ කරුණු වූ අතර, යශෝදා වික්‍රමසූරිය සහ ෆෙයිත් බෙකර් නැමැති අයව මුණගැසී කට උත්තරයක් ගැනීමට ලුසී තීරණය කළේ මේ හේතුව නිසා ම ය.

"යශෝදට කවද්ද මාචෙලෝව අන්තිමට මුණගැහුණේ?"

ෆයිල් කවරයෙන් දෙනෙත් අහකට ගත් ලුසී එම ප්‍රශ්නය අසා යළිත් යශෝදා දෙස ගැඹුරු බැල්මකින් බලා සිටියා ය. ඇය මෙම ප්‍රශ්නයට ලබාදෙන පිළිතුර මත මෙම පරීක්ෂණයේ අවසානය හෝ ආරම්භය තීරණය වනු ඇත.

යශෝදා ඒ මොහොතෙහි කිසිදු වෙනසකින් තොරව ම, සංසුන්ව මෙසේ පැවසුවා ය.

"අගෝස්තු 22 වෙනිදා, හවස 7ට"

ඇය එය නිවැරදිව ම කීවා ය. එය සියයට සියයක් ම නිවැරදි ය. මාචෙලෝගේ නිවසෙහි මෙහෙකාරියගේ කට උත්තරයට අනුව, යශෝදා ඇයගේ මිතුරිය වූ ෆෙයිත් බෙකර් නැමැත්තිය සමඟ මාචෙලෝ මිය ගිය දින රාත්‍රී 7ට ඔහුගේ නිවසට ගොස් ඇත.

"මට දැනගන්න පුළුවන් ද, ඒකට හේතුව මොකද කියලා?"

"ඔව් මිසිස් ලුසී, මාචෙලෝ අපිට රාත්‍රී කෑමට ආරාධනා කළා, අපි හරියට ම රාත්‍රී 7 වෙද්දී සොලිකොෆෙන්වල තියෙන මාචෙලෝගේ නිවසට ගියා"

"අපි, කිවුවේ ඔයයි, ෆෙයිත් බෙකරුයි"

"ඔව්"

"ඒ සාදයට වෙන කවුරුවත් ආව ද?"

"නැහැ" අපි දෙන්නා විතරයි.

"වෙන කවුරුවත් ම එදා හිටියේ නැහැ කියලා යශෝදට ස්ථිරව ම කියන්න පුළුවන්?"

"ඔව්, හැබැයි අපි ගෙදරට යද්දි නරීනේ හිටියා, නරීනේ කියන්නේ මාචෙලෝගේ ගෙදර වැඩකරන කෙනා"

"යශෝදා කොහොමද දන්නේ නරීනේ මාචෙලෝගේ ගෙදර වැඩ කරන කෙනා කියලා?"

"මාචෙලෝ අපිට නරීනෙව හඳුන්වලා දුන්නේ එහෙම"

"එතකොට ඔය දෙන්නා මාචෙලෝගේ ගෙදරින් එද්දිත් නරීනේ ගෙදර හිටියා"

"නැහැ, අපි එහෙට ගිහින් විනාඩි දහයකින් වගේ නරීනේ වැඩ ඉවර කරලා යන්න ගියා."

ලුසී මොහොතකට නතර වී කල්පනා කළා ය. යශෝදා පැවසූ දේවල් ඒ ආකාරයෙන් ම නරීනෙගේ කට උත්තරයේ ද සටහන් වී ඇත.

"එතකොට ඔය දෙන්නා ආයෙමත් ඒ ගෙදරින් පිටත් වුණේ කීයට ද?"

යශෝදා දෙනෙත් පුංචි කොට බිම බලා ගෙන සිතන්නට පටන් ගත්තා ය. ඇය බොරුවක් ගොතාගෙන සිටී නම් ඒ ආකාරයෙන් සිතීමට අවශ්‍යතාවයක් නොමැත. ඒ නිසාවෙන් ඇය පවසන්නට යන්නේ සත්‍යක් විය හැක.

"මට මතක හැටියට රෑ 11යි"

"ම්ම්ම්..." ලුසී මිමුනුවා ය.

ඇය කියූ දේ නිවැරදි නම් මෙම මරණයට ඇයගේ හෝ අනිත් තරුණියගේ කිසිදු සම්බන්ධයක් තිබීමට නොහැක. මාචෙලෝගේ අනතුර සිදුවී තිබුණේ අලුයම 3ත් 4ත් අතර කාලයේ දී බැව් මරණ පරීක්ෂණවලින් මේ වන විටත් අනාවරණය වී ඇත.

"ඔය දෙන්නා ආයෙමත් එද්දි මාචෙලෝ නිවසේ හිටිය ද?"

"ඔව්"

"වෙන කවුරුවත්?"

"නැහැ"

"මාචෙලෝ ඒ වෙද්දි එළියට යන්න ලෑස්ති වෙලාවත් හිටියේ නැද්ද?"

"නැහැ, හැබැයි අපි ගෙදර එද්දි මාචෙලෝ අපේ කාර් එක පස්සෙන් ආවා"

යශෝදා එසේ පවසත් ම ලුසීගේ කොළ පැහැති දෙනෙත් විශාල වී ගියා ය. එය මෙතෙක් ඇය නොදැන සිටි දෙයකි. එසේම මෙම පරීක්ෂණයට විශේෂ කරුණකි.

"ඒ කිවුවේ?" ඇය ඇසුවා ය.

"මිසිස් ලුසී, මීට කලින් මගේ ඇස් දෙකට කඳුළු ආවෙත් අපි මාචෙලෝ එක්ක ගත කරපු අන්තිම දවසේ සිදුවුණ ඒ සිද්දිය මතක් වෙලා. නැතිව ඇස් දෙකේ කඳුළු පුරෝගෙන අඬන්න තරම් මම දුර්වල කෙල්ලෙක් නෙමේ"

යශෝදාගේ මුහුණෙන් මඳ සිනහවක් මතු වී ආවා ය. ඒ සාංකාවත්, වේදනාවත් මිශ්‍ර වූ සිනා මාත්‍රයකි.

"මමයි, ෆෙයිතුයි කාර් එකේ එද්දි, මාචෙලෝ අපේ කාර් එක පස්සෙන් එයාගේ ෆෙරාරී එකේ ආවා, අපි පරිස්සමෙන් ගෙදරට යනව ද කියලා බලන්න. මගේ නිවස ගාව දී කාර් එකේ 'හෝන්' එකත් ගහලා එයා ආපසු හැරිලා ගියා, මාචෙලෝ කරුණාවන්ත මනුස්සයෙක්"

යශෝදා එම අවසන් වචන පේළිය ඉහළට ගත් දිගු හුස්මකුත් සමඟ පිටකළා ය.

"ම්ම්ම්..." ලුසී යළිත් කල්පනා කළා ය.

'සති තුනක් වැනි කෙටි කාලයකින් හෝටලයේ අධ්‍යක්ෂකවරයෙක් ඔහුගේ ලේකම්වරුන් දෙදෙනාට රාත්‍රී සාදයක් දීම සාමාන්‍ය දෙයකි. එහෙත් ඔවුන් යළිත් නිවසට යනතුරු තමන්ගේ කාරයෙන් ඔවුන් පිටුපසින් විත් ඔවුන්ව නිවසට හැරලවීම?'

ඇයගේ දෑස යළිත් යශෝදා දෙසට හැරිණ. මේ කතාව තුළ ඇය නොදන්නා වූ තවත් දේවල් තිබිය හැක. ඒවා සොයා ගැනීමට නම් මාචෙලෝ ටියුලිප් හෝටලයට පැමිණි දා සිට සිදුවූ සියලුම සිදුවීම් එකිනෙක පරීක්ෂාවට ලක් කළ යුතු ය. පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා සහ මෙතෙක් ලැබී ඇති සියලුම කරුණු සලකා බැලීමේ දී මෙය සම්පූර්ණයෙන් ම හදිසි අනතුරක් නිසා සිදුවූ මරණයකි. එහෙත් නරීනේ සහ යශෝදාගේ කට උත්තරවල

සඳහන් වන ආකාරයට මාචෙලෝ මිය ගිය දින රාත්‍රියේ ඔහු තම ආයතනයේ ම සේවිකාවන් දෙදෙනකු වෙනුවෙන් රාත්‍රී සාදයක් පවත්වා ඇත. ඔහුගේ මරණය සිදුවන්නේ හරියට ම මෙම රාත්‍රී සාදය අවසන් වී පැය හතරක් වැනි කෙටි කාලයක් තුළ දී ය.

ඒ සියල්ලට ම වඩා යශෝදා අවසානයේ දී මතුකළ කාරණය ලුසීගේ මනස තුළ කැකෑරෙමින් ඇත.

"සාදය අවසන් වී ඔවුන් දෙදෙනාව නිවසට හැරලවීම, ම්ම්ම්,..." ඇය යළිත් සිතන්නට වූවා ය.

සමහර විට යශෝදා කියූ පරිදි ම මෙය ඔහුගේ කරුණාවන්ත භාවය නිසා ම කළ දෙයක් විය හැක. එසේත් නැතහොත් මාචෙලෝ සහ මෙම තරුණියන් දෙදෙනා අතර රාජකාරී මට්ටමට වඩා එහා ගිය වෙනත් සම්බන්ධයක් තිබිය හැක. කතාවක කොටස් වෙන් වෙන්ව දැන ගැනීමට වඩා මෙම කතාව සම්පූර්ණයෙන් ම දැන ගත යුතු යැයි ලුසී මේ මොහොතේ දී තීරණය කළා ය. එය පරීක්ෂණයට වැදගත් වනු ඇත. එසේ නැතහොත් නොවැදගත් කාරණා ලෙස බැහැර කිරීමට සිදුවනු ඇත.

"යශෝදා, අගෝස්තු පළවෙනිදා මාචෙලෝ මුලින් ම වැඩට ආපු දවසේ ඉඳන් අගෝස්තු 22 දෙවැනිදා ඔයයි, ෆෙයිත් බේකරුයි, මාචෙලෝගේ ගෙදරින් එළියට ආපු රාත්‍රී 11 වෙනකන්, සිද්ද වෙච්ච හැමදේම මට දැනග න්න ඕනේ. ඒ කතාව සමහර වෙලාවට මේ මරණයට අදාල නොවෙන්න පුළුවන් එහෙත් මම කැමතියි ඒ සේරම දැනගන්න"

"එහෙත් ඊට කලින්!"

එතැනින් නැවැත්වූ ලුසී මොහොතක් කල්පනා කළා ය.

"යශෝදා, ඔයා කලින් කිවුවා මාචෙලෝ ඔයාගේ නිවස ළඟට ම ආවා කියලා, ඊට පස්සේ එයා කොහේට හරි යනවා කියලා කිවුව ද?"

"නැහැ මිසිස් ලුසී, මට එහෙම මතකයක් නම් නැහැ, මට මතක හැටියට එයා කාර් එක හරවගෙන ආයෙමත් එයාගේ නිවස පැත්තට ගියේ"

"මතකයක් නැහැ කිවුවේ"

ලුසීගේ මුවින් එම ප්‍රශ්නය පිටවෙත් ම යශෝදා සියුම් සිනහවකින් යුක්තව මෙසේ පැවසුවා ය.

"අපි ඒ වෙලාවේ මත්පැන් අරගෙන හිටියේ, එදා සාදයේ දී"

"ම්ම්ම්,..." ලුසී මිමුනුවා ය.

සාදයක දී මත්පැන් ගැනීමේ වරදක් නැත.

ඒ සිතුවිල්ලත් සමඟ ම ඇය මීට පෙර කියවා තිබුණු මාචෙලෝගේ මරණ පරීක්ෂණ වාර්තාවේ වූ යමක් ඇයගේ මතකයට ආයෙන්, තමා ඉදිරියේ වූ ෆයිල් කවරය තුළ වූ මාචෙලෝගේ සිරුරේ වෛද්‍ය වාර්තාව ඈ යළිත් කියවන්නට පටන් ගත්තා ය.

එහි සඳහන් වන ආකාරයට '**අනතුර සිදුවන අවස්ථාවේ දී ඇලෙක්සැන්ඩ්‍රියා මාචෙලෝ මත්පැන් පානය කොට ඇත. එසේම ඔහුගේ කාරයේ තිබී වොඩ්කා බෝතලයක සුන්බුන් හමුවී ඇති අතර, ඔහුගේ රුධිරයෙහි, කොකේන් නම් මත්ද්‍රව්‍යය අන්තර්ගත වූ බව ද**' මරණ පරීක්ෂණ වාර්තාවේ සඳහන් කොට ඇත.

එය කියවා අවසන් කළ ලුසී යළිත් යශෝදා දෙස බලා මෙසේ ඇසුවා ය.

"යශෝදා මොනවද එදා රෑ ඔයාලා ගත්තු මත්පැන් වර්ගය ?"

"වයින් "

"මාචෙලෝ "

"මාචෙලොත් බිවුවේ වයින් විතරයි"

ලුසිනෙගේ ඇහි බැම් යළිත් පුංචි වී ගියා ය. "ඔයාට ඒක හරියට ම කියන්න පුළුවන් ද"

"ඔව් සහතිකව ම කියන්න පුළුවන්, මොකද අපි තුන්දෙනා ම ඒ වෙලාවේ බිවුවේ වයින් විතරයි"

"එතකොට මත්ද්‍රව්‍ය?"

"නැහැ මිසිස් ලුසී, මමවත්, ෆෙයිත්වත් මත්ද්‍රව්‍ය පාවිච්චි කරන අය නෙමෙයි, පොලිසියට ඒක මගේ රුධිර පරීක්ෂාවකින් ම බලාගන්න පුළුවන්" ඇය එම වචන ස්ථිරව ම පිටකළා ය.

යශෝදාගේ එම පිළිතුරත් සමඟ, ලුසී සිරෝබ්‍යාන් ඇයගේ තීරණය ගෙන තිබිණ. සාදයේ දී වයින් පානය කළ මාචෙලෝ එයින් පැය තුනකට පසුව යළිත් වොඩ්කා පානය කිරීමට හේතුවක් නැත. එසේම ෆෙරාරි වැනි මිල අධික රථයක් පදවන්නකුගේ කාරය තුළ ඔහුගේ රියදුරු අසුන අසල ම වොඩ්කා බෝතලයක් වැටී තිබීම සැක සහිත කරුණකි. මාචෙලෝගේ පුද්ගලික ලිපිගොනුවල ඔහු මත්ද්‍රව්‍යට ඇබ්බැහි වූවකු හෝ එවන් කිසිම දේකට සම්බන්ධ අයකු බවටත් කිසිදු වාර්තාවක් නොමැත. මෙතැන් සිට ඉදිරියට යාමට නම් මේ ගැටලු සියල්ල ම නිරාකරණය කරගත යුතු ය.

ෆයිල් කවරය වසා දැමූ ඇය යශෝදා දෙස ගැඹුරු බැල්මකින් බලා ඉතාමත් පැහැදිලි ස්වරයෙන් මෙසේ පැවසුවා ය.

"යශෝදා මට හැමදේම දැනගන්න ඕනේ, මාචෙලෝ ටියුලිප් හෝටලයට පැමිණි දවසේ ඉඳන්, සිද්ද වෙච්ච හැමදේම"

මෙය නිසැකවම කට උත්තරය ලබාදෙන තැනැත්තා තුළ තිගැස්මක් ඇති වෙන ප්‍රශ්නයකි. එහෙත් යශෝදා තුළින් එවන් කැලඹීමක් පෙනුණේ නැත.

ඇය දෙතොල් එකිනෙක විකා ගෙන ඇයගේ කලවා මතට අත් දෙක ගුළි කරගෙන ඍජුව හිඳගත්තා ය. ඇය එම ප්‍රශ්නය පිළිගත් ආකාරය ලුසීගේ සිත තුළ අවිනිශ්චිත වූ සැකයක් මතු කිරීමට සමත් විය.

'සමහරවිට අපරාද විමර්ශන ඒකකය අද දිනය තුළ දී ඇයගේ නිවසට පැමිණි පසුව, මෙම ප්‍රශ්නය මේ ආකාරයෙන් ම අසන බවත් ඇය දැනගෙන සිටින්නට ද ඇත. එසේ නැතහොත් ලුසී නිවසට පා තැබූ මුල් ම මොහොතේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ඇයගේ මනස තුළින් ම ඇය ගොතා අවසන් කරන්නට ඇත.'

කෙසේ හෝ ඍජුව හිඳගෙන ඇය තමන් දෙස බැලූ ගැඹුරු බැල්මෙන් ම, ඇය ඊට සූදානම් බැව් ලුසී දැනගත්තා ය.

"මිසිස් ලුසී සිරෝබියාන්, ඔයා ලෙස්බියන් ද?"

"මොකක්ද?" යශෝදා ඇසූ දේ ලුසිනෙට ඇසුණත් ඇය පැවසුවේ එම වචනය ම දැයි දැන ගැන්මට ඇය එසේ ඇසීය.

"ඔයා ලෙස්බියන් ද ලුසී?"

ලුසී එයට පිළිතුරක් දුන්නේ නැත, ඒ වෙනුවට ඇය මෙසේ ඇසුවා ය.

"ඔයා?"

"ඔව්"

ස්විස්ටර්ලන්තය ඒ වන විටත් සමලිංගික විවාහ නීති ගතකර ඇති බැවින් පොලිස් වාර්තාවල පවා ලිංගිකත්වය පිරවීමට ඇති කොටුවල 'ස්ත්‍රී', 'පුරුෂ' කොටුවලට අමතරව 'සමලිංගික' නොහොත් 'Gay' යනුවෙන් තවත් අතිරේක කොටුවක් ද ඇත. එසේම නීතිමය රාමුව තුළ ඕනෑ ම පුද්ගලයකුට තම ලිංගිකත්වය ගැන විවෘතව කතා කිරීමට හැකියාවක් තිබුණෙන් යශෝදාගේ ප්‍රකාශය සාමාන්‍ය ප්‍රකාශයක් ලෙස සැලකිය හැකි එකකි.

"ඒකයි මේ කතාවයි අතර තියෙන සම්බන්ධය මොකක්ද මිස් යශෝදා?"

"ලොකු සම්බන්ධයක් තියෙනවා මිසිස් ලුසී"

"යශෝදට අවශ්‍ය නම්, ගොඩක් පෞද්ගලික කරුණු අත්හැරලා මාචෙලෝට සම්බන්ධ දේවල් විතරක් කියන්න. ඒකේ ගැටලුවක් නැහැ"

එය ඇසෙත් ම යශෝදාගේ මුවින් යළිත් සිනහා රැල්ලක් මතු විය. ඇය එය ගණන් ගත් බවක් පෙනෙන්නට නැත. කාන්තාවක් ලිංගිකත්වය ගැන කතා කිරීමේ දී පසුබසින මුත් යශෝදා තුළ එවන් අපහසුතාවයකට ලක් වීමක් පෙනෙන්නට නැත.

"ජීවිතය කියන්නේ රහස් ගොඩක් හංගගෙන ජීවත් වෙලා මැරිලා යන එක නෙමේ ලුසී, මගේ ජීවිතයේ රහස් නැහැ. තියෙන හැම රහසක් ම මට හෙළිකරන්න පුළුවන්, මම ලෙස්බියන්, මේ කතාව කියන්න කලින් මම ලුසීගෙන් ඒ ප්‍රශ්නෙ ඇහැවුවේ එහෙම කාන්තාවකගේ හැඟීම් තේරුම් ගන්න පුළුවන් තවත් එවැනි ම කාන්තාවකට විතරක් නිසා"

"මට ඒ ගැන හරියට ම පිළිතුරක් දෙන්න බැහැ මිස් යශෝදා"

ඇය එසේ කියත් ම යශෝදා එක පිට එක දමා සිටි ඇයගේ දෙපා වෙන්කර ගත්තා ය. ඒවා පොළොවට සමාන්තරව තබා මඳක් මෑත්කර හිඳගත්තා ය. ඇයගේ දෙපා අතරින් පෙනෙන ඇය ඇඳ සිටි සුදු පැහැ පැන්ටිය දෙස බැලූ ලුසීගේ දෙනෙත් තුළ දිලිසීමක් ඇති විය. කොළ පැහැ දෙනෙතට සූර්ය කාන්තිය වැටීමේ දී ඇතිවෙන දිලිසීම මෙන් ඒවා දිලිසුණෙන් යශෝදා ඒ දෙනෙත් දෙස එක එල්ලේ ම මොහොතක් බලා සිටියා ය. ඉන්පසුව තම දෙපා යළිත් එක පිට එක දමා ගත් ඇය තවත් සියුම් සිනහවකින් මෙසේ පැවසුවා ය.

"මිසිස් ලුසී, මේක ටිකක් අමුතු කතාවක්"

Chapter 01

ස්විස්ටර්ලන්තය ගිම්හාන කාලයට හරි ම ලස්සන යි. කවුරු හරි ඇහැවුවොත් ස්වර්ගය තියෙන්නේ කොහෙද කියලා, මම කියනවා,

"ඒක තියෙන්නේ ස්විස්ටර්ලන්තයේ සොලිකොෆේන්වල" කියලා.

මම ස්වර්ගය දැකලා නැහැ. එහෙත් ස්වර්ගයට මීට වඩා ලස්සනක් තියෙන්න බැහැ. පොළොවතලයේ තියෙන්න ඕනේ හැම ලස්සනක් ම මේ පුංචි සොලිකොෆේන්වල තියෙනවා. මම ඒ ලස්සනට ආදරෙයි.. ස්විස්ටර්ලන්තයට පය ගාපු දවසේ ඉඳන් මම මේ ලස්සනට මගේ මුළු හදවතින් ම ආදරේ කළා.

දිනය 2018 අගෝස්තු 1

වෙලාව උදේ අටයි,

"දෙවියනේ මම දැනටමත් පරක්කුයි"

අටහමාර වෙන්න කලින් හොටෙල් එකේ ඉන්න ඕනේ. වැඩ පටන් ගන්නේ නවයට. එහෙත් අටහමාර වෙද්දි අපි හොටෙල් එකේ ඉන්න ඕනේ.

මම ඉක්මනට ලෑස්ති වුණා. බස් එක සොලිකොෆෙන් බයිසිකල් කඩේ ළඟට හරියට ම අටයි පහ වෙද්දී එනවා. මට තියෙන්නේ තව විනාඩි පහයි. බස් එක මිස් වුණොත් ඊළඟ එක එන්නේ විනාඩි පහළොවක් පරක්කු වෙලා. මම එව්ලීන් ක්‍රීම් එක ඉක්මනට ම මුහුණේ අතුල්ල ගත්තා. අද, ලස්සනට ලෑස්ති වෙවී ඉන්න වෙලාවක් නැහැ. මම ඇඳගෙන හිටියේ හෝටලයේ නිල ඇඳුම. කළු පාට දිග කලිසමයි. සුදු පාට බ්ලවුස් එකයි. සපත්තු දෙකත් අතට ගත්තු මම ඉක්මනට දුවන්න පටන් ගත්තා. මගේ නිවස ළඟ ඉඳන් බයිසිකල් කඩේ බස් හෝල්ට් එකට මීටර් තුන්සීයක් විතර, ඒක ඒ තරම් ලොකු දුරක් නෙමෙයි. දුවලා ගියොත් මට විනාඩි පහකින් ම ඒ දුර දුවන්න පුළුවන්.

දොර වහලා දාපු මම තරප්පු පෙළ දිගේ පහතට ඇවිත් දුවන්න පටන් ගත්තා. කෙල්ලෙක් පාරේ දුවන එක මේ මිනිස්සුන්ට අමුතු දෙයක් නෙමෙයි. මේ ගොඩක් අය වැඩට යන්න පරක්කු වුණා ම කරන්නේ එහෙම තමයි. ඒකට ලැජ්ජා වෙන්න දෙයක් නැහැ. බස් එකේ යන අය බස් හෝල්ට් එකට දුවනවා. එහෙම නැත්නම් බයිසිකලයෙ ම වැඩට යනවා.

මම දුවගෙන පහතට එද්දී සයිමොන් අංකල් ගේ ඉස්සරහා තිබ්බ මල් පාත්තිවලට වතුර දානවා. එයා ජර්මන්, හමුදාවෙන් විශ්‍රාම ගිය මේජර් කෙනෙක්. වයස අවුරුදු හැත්තෑවක් විතර ඇති. උදේ පාන්දර නැගිට්ට හැටිය එයා කරන්නේ මල් පාත්තියට වතුර දාන එක.

"සුබ උදෑසනක් සයිමොන් අංකල්"

"සුබ උදෑසනක් යසා"

එයාට යශෝ කියන එක උච්චාරණය කරන්න බැහැ. ඒ නිසා කියන්නෙ ම "යසා" කියලා.

නිවස වත්තේට ගහපු වැටෙන් හැරුණත් එක්ක ම නිවස පිටි පස්සෙන් වැටිච්ච අතුරු පාරක් තියෙනවා. ඒක දිගේ ම දිවුව ම වැටෙන්නෙ බයිසිකල් කඩේත් එක්ක තියෙන සොලිකොණෙන් ප්‍රධාන පාරට.

මම එතනට යනකොටත් බස් එක, හෝල්ට් එකේ නවත්තලා. මම අතුරු පාරෙන් හැරෙද්දි ම බස් එක යන්න අද්දනවා. මම දුවලා ගිහින් බස් එක පිටුපස්සට තට්ටුවක් දැම්මා. සමහර වෙලාවට එහෙම කළත් බස් එක නවත්තන්නේ නැහැ. වෙලාව නම් වෙලාව. ඊට වඩා දෙයක් නැහැ. මම හයියෙන් තට්ටු කරපු නිසාද කොයේද බස් එක නැවැත්තුවා. වාසනාව, මම ඉක්මනට ම නැගගත්තා.

බස් එකේ හැම සීට් එකක් ම පිරිලා. සාමාන්‍යයෙන් සොලිකොණෙන්වල බස් ඒ විදියට පිරෙන්නේ නැහැ. එහෙත් උදේටයි හවසටයි බස්වල කොහොමත් සෙනඟ.

මම හිටගෙන ම සපත්තු දෙක දාගත්තා.

කොණ්ඩේත් පොඩ්ඩක් හදාගත්තා.

"මොන මඟුලක් ද මන්දා"

පොඩ්ඩක් දිවුවත් මට දාඩිය දානවා. මුහුණට ගාපු ක්‍රීම් දහඩියත් එක්ක වැක්කෙරිලා නළල දිගේ මුහුණට එනවා. මම හිමින් සීරුවේ වටපිට බලලා මගේ බ්ලවුස් එකේ කොලර් එකෙන් ම දහඩිය පිහ දැම්මා. මම වට පිට බැලුවේ හිතට ඇතිවෙච්ච ලැජ්ජාව නිසා. එහෙත් මෙහේ එහෙම නැහැ. අනිත් අය කරන්නේ මොනවද, ඒ අය අඳින්නේ මොනවද, ඒක කාටවත් වැඩක් නැහැ. කොටින්ම හෙළුවෙන් පාරෙ ගියත් ඒක අනිත් අයට අදාල නැහැ.

⚢

බස් එක හෝටලය ළඟ තියෙන, "ටියුලිප්" බස් නැවතුමට එද්දී වෙලාව හරියට ම අටයි විසිපහයි.

හෝටලයට දුවලා යන්න බැහැ. හයියෙන් ඇවිදන් යන්න ඕනේ. මම තමයි සෙකට්‍රී, ජූනියර් සෙකට්‍රී. තව ම ඉන්ටර්න්. මම වැඩ කරන්නේ තවත් කෙල්ලෙක් එක්ක. එයා මට වැඩිය අවුරුද්දක් සීනියර්.

ටියුලිප් කියන්නේ තරු පහේ හෝටලයක්. යුරෝපයේ විදියට නම් සුඛෝපභෝගී එකක්. ටියුලිප් හෝටලයේ වැඩ කරන සේවකයන්ට ඇතුල් වෙන්න හෝටලය පිටිපස්සෙන් වෙන ම දොරක් තියෙනවා. මැනේජර්ලා විතරක් නෙමෙයි, ඩිරෙක්ටර් බෝඩ් එකේ අයත් රැකියාවට එද්දී ඇතුළට එන්නේ ඒ දොරෙන්. උස් පහත් කමක් නැහැ. වේටර්, කිචන් හෙල්පර්ගේ ඉඳන් ඩිරෙක්ටර් වෙනකන් එක සමාන යි.

මම ඇතුළට එද්දී සිකියුරිටි එකේ හිටපු "ආතුර්" මගේ දිහා බලලා හිනා වුණා.

"සුබ උදෑසනක්, යශෝ!"

"සුබ උදෑසනක් ආතුර්!"

මම ටයිම් කාඩ් එක මැෂින් එකට තිබ්බා. ඇතුල් වීම හරියට ම සටහන් වෙන්න නම් "බීප්" කියන සද්දයක් එන්න ඕනේ.

හෝටලයේ පිටුපස තියෙන ඇතුල් වීමේ දොර හැරිය ම ඊට පස්සේ තියෙන්නේ දිගු කෝරිඩෝ එක. හොටෙල් කාමර අතර තියෙන කොරිඩෝ වගේ ම ඒකත් රතු පාට කාපට් දාපු එකක්. කොරිඩෝව උඩ එක දිගට කවාකාර විදුලි පහන් එල්ලලා තියෙනවා. මම කලින් කිවුවා වගේ ම, ටියුලිප් කියන්නේ තරු පහේ එකක්. බර්න්වල තියෙන හොඳ ම ලක්ෂරී හෝටලයක්. ඒ නිසා තරු පහේ හෝටලයක තියෙන ස්ටෑන්ඩර්ඩ්ස් සේරම මේ හෝටලයේ තියෙනවා.

කොරිඩෝව දිගේ ඉස්සරහට ආව ම එක පැත්තකින් තියෙනවා කිචන් එකට යන ප්‍රධාන දොර. අනිත් පැතිවල, සේවකයන් වෙනුවෙන් වෙන් වෙච්ච ආපන ශාලා, රෙස්ට් රූම්, ලොන්ඩරි, මේ හැම දේම. කොරිඩෝව ඉවර වෙන්නේ තවත් දොරකින්, ඒ දොරෙන් එහා පැත්තේ තියෙන්නේ හෝටලයේ ප්‍රධාන ශාලාව.

මැනේජ්මන්ට් එකෙයි ඩිරෙක්ටර් බෝර්ඩ් එකෙයි කාමර තියෙන්නේ මේ ශාලාව එහා පැත්තේ. ඒකට හෝටලය හරහා යන්න ඕනේ.

හෝටලයේ මම කැමතිම තැන තමයි මේ ශාලාව. පුදුම ලස්සන යි. තරු පහේ හෝටලයක ප්‍රධාන ශාලාවකට වඩා

"ඒක නිකන් පැරණි කෞතුකාගාරයක් වගේ"

ශාලාව මැද තියෙනවා මලක් වගේ දැල්වෙන විශාල විදුලි ලාම්පුවක්. මම දන්න විදියට ඒ විදුලි ලාම්පුවේ පොඩි බල්බ සීයකට වඩා තියෙනවා. ඒක අඩි දහයකටත් වැඩිය විශාල එකක්. මුළු ශාලාවට ම එළිය දෙමින් පුදුමාකාර ප්‍රෞඪත්වයකින් මේ විදුලි ලාම්පුව හෝටලය හරි මැදට කේන්ද්‍ර වෙලා තියෙනවා.

ශාලාවේ හරි කෙළින් ප්‍රධාන දොර, ඒක ළඟ ම රිසෙප්ෂන් එක. විරුද්ධ

පැත්තෙන් රිසෙප්ෂන් එකේ ම පරිගණක අංශය.

මම ඇවිදගෙන ආපු පැත්තට අනිත් පැත්තේ තවත් විශාල භූමි ප්‍රදේශයක් තියෙනවා.

වටේට ම සෝපා දාලා 'ලොබී' එකක් වගේ හදලා තියෙන මේ කොටසින් පස්සේ තමයි හෝටලයේ මැද ශාලාව තියෙන්නේ, ඒක එළිමහන් එකක්. හෝටලයේ පවත්වන උත්සව, සාද වගේ දේවල් ගොඩක් වෙලාවට තියන්නේ මේ එළිමහන් භූමියේ. ඒක වටේ තමයි තට්ටු හතරක් උසට අමුත්තන්ගේ නවාතැන් කාමර පේළිය තියෙන්නේ.

මම ශාලාව දිගේ ගිහින් පරිගණක අංශය ළඟින් වැටිලා තියෙන තරප්පු පෙළ නගින්න පටන් ගත්තා. හෝටලයේ සම්පූර්ණ පොළව ම සුදු ටයිල්ස්වලින් ලස්සන කරලා තියෙනවා. හෝටලයේ තියෙන හැම තරප්පු පෙළක්මත් එහෙමයි. මේ තරප්පු පෙළ අවසානයේ තියෙනවා,

'ඇතුල්වීම පාලක මණ්ඩලයට පමණයි' කියලා දැන්වීමක් ගහපු වීදුරු දොරක්.

ඒකට පස්සේ හමුවෙන කොරිඩෝව දිගේ තමයි ඩිරෙක්ටර් බෝඩ් එකේ සහ අපේ කාමර තියෙන්නේ.

තරප්පු පේළිය නැගලා උඩට එද්දි මම දැක්කා උස මහත්මයෙක් වීදුරු දොර ඇරලා ඇතුළට යනවා. හෝටලයේ මම අවුරුද්දක් වැඩ කරලා තියෙනවා. ඩිරෙක්ටර් බෝඩ් එකේ ඉන්න අයවත්, මැනේජ්මන්ට් එකේ ඉන්න අයවත් මම අඳුරනවා.

'එහෙත් මේ පුද්ගලයා?' මම කවදාවත් දැකලා නැති කෙනෙක්.

මම එයාව දැක්කේ පිටුපසින් වුණත් මට ඒ උස අනුව කියන්න පුළුවන්, එහෙම කෙනෙක් මුළු පාලන අංශයේ ම නැහැ. ඒක පුදුම උසක්. මම හිතන විදියට අඩි හයකටත් වඩා උසයි. මම ටිකක් හයියෙන් ඇවිදගෙන එයාගේ ඉස්සරහට ගියා. එයාගේ මුහුණ දිහා බලන්න.

'ඕ, මෙයා නම් අපේ හෝටලයේ පාලන අංශයේ කෙනෙක් වෙන්න කොහොමත් බැහැ'

උස, දුඹුරු පාට කොණ්ඩයක් තියෙන, සම්පූර්ණ නිල් පාට සූට් එකකින් ම සැරසුණු කෙනෙක්.

"මට සමාවෙන්න මහත්මයා" මම ඇවිදන් යන ගමන් එයාට කතා කළා.

මට තියෙනවා කට වහගෙන ඉන්න බැරි පුරුද්දක්, හැම මඟුලකට ම අත දාන්න ඕනේ. මගේ කට හඬ ඇහුණ ම එයා මගේ දිහා හැරිලා බැලුවා.

'හම්මෝ, මාව ගල් ගැහිලා ගියා, අපේ හෝටලයේ තියෙනවා ග්‍රීක දෙවි

කෙනෙක්ගේ සුදු මාබල්වලින් හදාපු පිළිමයක්, හරියට ම ඒක වගේ, එයාව දැක්ක ගමන් මට මතක් වුණේ ඒ පිළිමය'

'දිගටි මුහුණක්, දුඹුරු පාට කොණ්ඩෙට ම ගැළපෙන, නිල් ඇස් දෙකක්, පළල් නළලක්, උල් නහයක්. සාමාන්‍යයෙන් ඒ වගේ උල් නහයවල් තියෙන්නේ කාන්තාවන්ට විතරයි. සම්පූර්ණයෙන් ම ෂේව් කරපු මූහුණක්. "අර පිළිමය වගේ ම හරි ම පැහැදිලියි' එයාව දැක්ක හැටිය මම එයා දිහා ඇස් දෙකත් ලොකු කරගෙන බලාගෙන ඉන්න ඇති.

'මට කොහොමත් ඒ වගේ පිස්සුවකුත් තියෙනවා, කොල්ලෙක්ව දැක්ක ගමන් ටියුබ් ලයිට් එකක් වගේ එක පාර ම ඩිම් වෙන, ඒ වෙලාවට ඔළුවේ තියෙන නහරවල් සේරම නවතිනවා. කට ඇරෙනවා, ඇස් ලොකු වෙනවා, පිස්සියෙක් වගේ බලාගෙන ඉන්නවා'

"ඔව් මිස්"

"මිස්"

"හෙලෝ"

එයා තුන් පාරක් විතර කියන්න ඇති. එහෙත් මට ඇහුණේ ඒ අන්තිම එක විතරයි. ඩිම් වෙච්ච ටියුබ් ලයිට් එකක් එක පාර ම පත්තු වෙනවා වගේ ආයෙමත් මගේ නහරවල් වැඩ කරන්න පටන් ගත්තා.

"හ්ම්, සමාවෙන්න මහත්මයා මේක පාලක අංශය"

මම ගොත ගැහුවා. ඒ ඇස් දෙක එක එල්ලේ ම මගේ දිහාවට හැරිලා.

එයා උස නිසා මම ඔළුවත් උස්සලා එයාගෙ ඇස් දෙක දිහා බලාගෙන හිටියා. ඒ ඇස් ලා නිල් පාට ද, තද නිල් පාට ද, ඒ තරම් ලස්සන, අනේ මන්දා?

හැඟීම් වලට අනුව පාට වෙනස් වෙන ඇස් ගැන මම අහලා තියෙනවා. මගේ ඇස් දෙකේ නම් පාට වෙනස් වෙන්න දෙයක් නැහැ. උපන් දා ඉඳන් ම එක ම පාට. තනිකර කළු.

එයා වචනයක්වත් කතා කළේ නැහැ. ඍජුව හිටගෙන මගේ දිහා බැලුවා, කිසිම හිනාවක් නැහැ. ඉතාලි කාරයෙක් වගේ. ඒ විදියට හරි කෙළින් ගොඩක් වෙලාවට හිටගන්නේ ඉතාලියේ අය.

හරියට ම මේ වෙලාවේ මම දැක්කා **ෆෙයිත්** අපේ දිහාට එනවා. ඇය ආවේ වේගවත් ගමනකින්. ෆෙයිත් කියන්නේ මගේ සීනියර්. ඩිරෙක්ටර්ට පුද්ගලික ලේකම්ලා දෙන්නෙක් ඉන්නවා, එක්කෙනෙක් මම, අනිත් කෙනා ෆෙයිත්. **එයා මගේ සුරංගනාවී, මම එයාට කැමතියි, ඒක වෙන ම කතාවක්, මේක කියවගෙන යද්දි ඔයාලා ඒක දැනගනියි.**

අපේ දිහාට දුවගෙන ආපු ෆෙයිත් මගේ දිහා හැරිලවත් බලන්නේ නැතිව අර

ග්‍රීක දෙවියට අතට අත දුන්නා.

"වෙල් කම් ටූ හොටෙල් ටියුලිප් සර්!"

මට නිකන් මොකක්ද වුණා වගේ. ෆෙයිත් අත දෙද්දී ග්‍රීක දෙවියත් ලස්සනට හිනාවෙලා මෙහෙම ඇහුවා.

"ඔබතුමිය ෆෙයිත් බෙකර් වෙන්න ඕන?"

"ඔව්, අද උදේ ඔබතුමා කතා කළේ මට"

"හා" එයා ආයෙමත් යාන්තමට සිනහාසුණා. ඒ හිනාවේ කඩවසම් කමකටත් වැඩිය තියෙන්නේ පොඩි ආඩම්බරයක්.

"එතකොට මේ?" ඔහු ඊළඟට හැරුණේ මගේ දිහාවට.

මම, එයා කවුද කියලා දන්නෙවත් නැතිව මම මොකටද මාව හඳුන්වා දෙන්නේ? එයා මගේ දිහා බැලුව ම මම බැලුවේ ෆෙයිත් දිහා. මම ඇස් දෙක පුංචි කරලා ෆෙයිත් දිහා බලපු විදියට එයාට කාරණය තේරෙන්න ඇති.

"මිස්ටර් මාචෙලෝ, මේ යශෝදා, ඇයත් ඔබතුමාගේ ලේකම්වරියක්"

මොනවා මාව කරකවලා අත හැරියා වගේ. ඇඟ දිගේ කරන්ට් එකක් දුවනවා වගේ මාව ගැස්සිලා ගියා.

"ඔබව මුණගැසීමත් සතුටක් යශෝ... දා, මම ඒ නම කියපු විදිය හරි වෙන්න ඕනේ"

"යශෝ, මගේ නම යශෝ" මම ගොත ගැහුවා.

"ඒක කලින් එකට වඩා ලේසියි"

ඔහු ආයෙමත් හිනා වුණා. ඒ හිනාවත් එක්ක ම එයා ෆෙයිත් එක්ක කොරිඩෝව දිගේ ඇවිදගෙන ඉස්සරහට ගියා. ෆෙයිත් එයාට ඩිරෙක්ටර් රූම් එක පෙන්නුවා. ඇයට ස්තුති කරලා ඔහු ඒ කාමරය ඇතුළට ගියා.

ෆෙයිත් එතන හිටගෙන ම මගේ දිහා හැරුණා. මම විදුලියක් වගේ එයා ළඟට දුවගෙන ගියා.

"ෆෙයිත් කවුද ඒ?"

"මෝඩී ඒ අලුත් ඩිරෙක්ටර් ඇලෙක්සැන්ඩ්‍රියා මාචෙලෝ, මිස්ටර් ෆර්ඩිනැන්ඩ්ව වෙන හෝටලයකට මාරු කරලා යවලා"

ෆර්ඩිනැන්ඩ් කිවුවේ හෝටලයේ පරණ ඩිරෙක්ටර්, ටියුලිප් හෝටලය පාලනය කළේ ඉතාලි ආයතනයක් නිසා අපේ හෝටලයේ ඩිරෙක්ටර් බෝඩ් එකේ ඉන්න හැමෝම ඉතාලි ජාතිකයින්.

Chapter 02

එදා හවස ඩිරෙක්ටර් බෝඩ් එකේ රැස්වීමක් තිබ්බා.

ඒකට අලුත් ඩිරෙක්ට ඇලෙක්සැන්ඩියෝ මාවෙලෝ, ඒ වගේ ම ෆැසිලිටි එකේ ප්‍රධානියා රොද්‍රිගස්, වගේ ම රෙස්ටුරන්ට් සහ මුළුතැන්ගෙයි ප්‍රධානියා විදියට හිටපු ක්‍යාරා ෆීද්‍රෝත් ආවා. ඔය නම් කිවුව සමහර අය හෝටලයේ දකින්න ලැබෙන්නේ රැස්වීම්වල දී විතරයි. අනිත් වෙලාවට ඔෆිස් කාමරයේ නැත්නම් පුද්ගලික කාමරයේ. ඩිරෙක්ටර්ස්ලා තුන්දෙනාට හෝටලයෙ ම සූයිට්වල වෙන ම කාමර තුනක් තිබ්බා. ගෙස්ට් කාමර වගේ ම ඒවා සුද්ද පවිත්‍ර කරන එකත් හෝටලයේ පවිත්‍ර අංශයේ අයගේ ම රාජකාරිය.

කොහොම හරි රැස්වීම තිබ්බේ අලුත් ඩිරෙක්ටර්ව හඳුන්වා දෙන්න නෙමෙයි.

හෝටලය වෙනින් ඉතාලි කොම්පැනියකට පවරා ගත්තා කියන්න.

මම ඉන්ටර්න් වුණාට කළමනාකරනය ගැන මට හොඳ ඉවක් තියෙනවා. ආයතනයක් වෙන එකකට පවරා ගත්ත ම ගොඩක් දේවල් වෙනස් වෙනවා. ලොකු ම දේ තමයි දැන් තියෙන රස්සාවල වෙනසක් සිද්ද වෙන එක.

එහෙත් අලුත් ඩිරෙක්ටර් නැගිටලා සේවකයන්ට පොරොන්දු වෙලා කිවුවා හැම දෙයක් ම කලින් වගේ ම සිද්ද වෙනවා කිසිම වෙනසක් වෙන්නේ නැහැ කියලා.

'ඒවා සීනි බෝල කතා. තව ටික දවසකින් එකින් එක රස්සා නැති වෙලා යයි, අලුත් කට්ටිය හොටෙල් එකට එයි, සමහර වෙලාවට මගේ රස්සාවත් නැතිවෙන්න පුළුවන්'

මම ෆෙයිත් දිහා බැලුවා. ඒ බලද්දි එයාගේ ඇස් දෙකත් මගේ දිහාට හැරුණා.

'එයත් මම හිතන දේ ම හිතනව ද කොහෙද'

⚢

එදා හවස ගෙදර ගියාට පස්සේ මගේ ඔළුව කැක්කුමයි වගේ.

මම අර කාරණය ගැන ගොඩක් හිතන්න ඇති. ඒක මගේ දුර්වලකමක්. මොකක් හරි දෙයක් දැනුණ ම ඒක පස්සේ හිත හිත ගොඩක් දුර යනවා. අන්තිමට ඒක නිකන් ම ඔළුවේ කැක්කුමක් බවට පත් වෙනවා.

'ඇත්තටම රස්සාව නැති වුණොත්'

මම නෙමෙසීන් එකක් බීලා ඇඳේ හිඳගෙන කල්පනා කළෙත් ඒක. එහෙම වුණොත් ලොකු විනාසයක් තමයි සිද්ද වෙන්නේ. ස්විස්ටර්ලන්තයේ තනියෙම ජීවත් වෙන මනුස්සයෙක් තමයි කරන රස්සාවේ තියෙන වටිනාකම දන්නේ. අනික මගේ රස්සාව හාස්කමකට වගේ මට ලැබුණ එකක්. මේ වගේ රටක 'සෙකට්රි ඉන්ටර්න්' කෙනෙක් වෙන එක ගොඩක් අයගේ හීනයක් විතරයි. මේකෙන් පස්සේ මම ඩිරෙක්ටර් සෙකට්රි. ඊටත් පස්සේ,

'ඔළුවෙන් වැඩ කළොත් ඉහළ මැනේජ්මන්ට් පෝස්ට් එකකට වුණත් යන්න පුළුවන්'

හොටෙල් ෆීල්ඩ් එකේ රස්සාවලට ගොඩක් සුදුසුකම් ඕනේ නැහැ. විශේෂයෙන් ම ගැහැනු වෙච්ච අපිට. හිතන්න පුළුවන් මොළයක් තියෙනව නම් කරන්න පුළුවන් දේවලුත් ගොඩක් තියෙනවා.

මම හිතුවා. ගොඩක් හිතුවා. මධ්‍යම රාත්‍රිය වෙනකන් ම හිතුවා. ඔරලෝසුවේ එකේ කනිසම වැදෙනකන් ම හිතුවා.

'මම කිවුවේ, ඒ මගේ හැටි, දෙයක් වෙන්නත් කලින් ඒ ගැන හිතනවා'

මේ හිතිල්ල නවත්තලා දාන්න ඕනේ. අනික තවම රස්සාව නැති වුණේ නැහැ. නිකන් බොරුවට ඒ ගැන හිතන්න ඕනේ නැහැ. මොන දේ වුණත් හිනා වෙලා ජීවත් වෙන්න ඕනේ. මම විදුලි පහන නිවලා දැම්මා.

මගේ කාමරය තිබුණේ දෙවැනි තට්ටුවේ. දෙවැනි තට්ටුව කිවුවට ඒක ඇත්තට ම සොල්දරයක්. මේ ගෙවල්වල වහලවල් හදන්නේ තුන්හුලස් විදියට. සීලිම ගහන්නේ වහලේ මැද ඉඳන් අඩි පහළොවක් විතර පහතින්. එහෙම වුණා ම ඒ තුන්හුලසේ හිඩක් ඇති වෙනවා. සමහරු මේක ගබඩා කාමරයක් විදියට පාවිච්චි කරනවා. නැත්නම් නිදන කාමරයක් විදියට හරිගස්සලා තවත් කෙනෙක්ට ජීවත් වෙන්න පුළුවන් විදියට කුලියට දෙනවා. මේ ගෙදරත් එහෙමයි.

මේ උඩු කොටසේ කාමර දෙකක් හදලා තියෙනවා. එකක මම, අනිත් එකේ තවත් ගැහැනු ළමයෙක් ඉන්නවා. එයා නම් රුසියානු කෙනෙක්.

අපි දෙන්නගේ කාමර දෙක ම දොරවල් දෙකක් දාලා වෙන් කරලා තියෙන්නේ. මගේ කාමරයේ දොර ඇරිය ම එතනින් අඩි දහයක් විතර පරතරයකින් අනිත් කාමරයේ දොර. මේ දෙක මැදින් තියෙන පොඩි කොරිඩෝවත් එක්ක තමයි පල්ලෙහාට යන තරප්පු පෙළ තියෙන්නේ. පඩි පෙළ වැටෙන්නේ ගෙදර සාලෙට.

මං ඉන්න කාමරය ගැන කිවුවොත්, ඒකේ එක පැත්තකින් තියෙන්නේ නිදන ඇඳ, අනිත් පැත්තේ මගේ ඇඳුම් රාක්කේ. කාමරය සම්පූර්ණයෙන් ම

රෝස පාට තීන්තෙන් පාට කරලා. ලස්සන මල් මෝස්තර එහෙමත් වටේ ම තියෙනවා. මීට කලින් සයිමොන් අංකල්ගේ දුව ඉඳලා තියෙන්නේ මේ කාමරේ ඒ නිසා කෙල්ලෙක්ට ඉන්න පුළුවන් විදියට හරි ම ලස්සනට කාමරය හැඩ වෙලා තියෙනවා.

මේ කාමරයේ මම ආස ම දේ තමයි හරියට ම කාමරය මැද තියෙන ලොකු රවුම් ජනේලය. ඒක ගෙදර මුදුන් වහලේ තියෙන ජනේලේ. එතනින් බැලුව ම මුළු මිදුලමත්, ගේ ඉස්සරහා තියෙන අතු පාරත්, ඒකට එහා පැත්තේ ඈතින් තියෙන කඳු පංතියත්, ගෙවල් පේළියත් බලන්න පුළුවන්.

මම ලයිට් එක නිවලා දාලා ඇඳේ ඉඳන් ම ජනේලයේ කොක්ක කරකවලා ඒක විවෘත කළා. ගිම්හාන කාලේ රාත්‍රියට හොඳට හුළං හමනවා. මේ සුළඟ හරි ම සනීපයි, ටිකක් සීතලයි. රෑට ජනේලය ඇරලා නිදාගත්ත ම හොඳට පොරෝගෙන නිදාගන්න පුළුවන්.

මම පොරෝනයෙන් ඔළුවත් එක්ක වහගෙන කළු පාට ආකාශයේ දිලිසෙමින් පායලා තියෙන සඳ දිහා බලාගෙන ඇස් දෙක වහගත්තා.

මේ වෙලාවේ එක පාර ම මගේ කන් දෙකට සද්දක් ඇහෙන්න ගත්තා. මම ඔළුවෙන් පොරෝනය අයින් කළා. දැන් මගේ කන් දෙකට ඒ සද්දේ හොඳට ඇහෙනවා. ඒක ටිකෙන් ටික වැඩි වෙන්න පටන් ගත්තා. ඒක ගෑනු කෙනෙක්ගේ කටහඬක්. එයා කෙඳිරි ගහනවා.

"මේක නම් වෙන්න ම බැරි දෙයක්"

සයිමොන් අංකල් විතරයි මේ ගෙදර ඉන්නේ, එයාගේ දුවත් විවහා වෙලා වෙන ගේකට ගිහින්. එයාගේ බිරිඳත් මිය ගිහින් අවුරුදු ගාණක් වෙනවා. මේ ගෙදර වෙන කවුරුත් ඉන්න බැහැ.

මම හිමින් සීරුවේ අඩිය තියලා ඇඳෙන් බිමට බැස්සා. බැහැලා දොර ළඟට ගිහින් කන තියලා ඇහුන්කන් දුන්නා. ඒ සද්දේ එන්නේ පහත සාලයෙන් නෙමෙයි, ඉස්සරහා කාමරයෙන්.

"ෂුවර් එකට ම අර රුසියානු කෙල්ල කොල්ලෙක්ව කාමරයට ගෙනල්ලා. එයා මහා මෝඩ කෙල්ලෙක්, සයිමොන් අංකල්ට ඇහුණොත් අද ම ඔය කෙල්ලට කාමරයෙන් යන්න වෙනවා"

මම කන තියාගෙන ඉදිද්දී අර සද්දේ තවත් වැඩිවෙන්න ගත්තා.

"එයා සෙක්ස් කළාට කමක් නැහැ, පිස්සියෙක් වගේ කෑගහන්නේ නැතිව"

සයිමොන් අංකල් කාමරය දෙද්දිම මට කිවුවේ,

"කාමරේට කිසිම පිරිමියෙක්ව වද්ද ගන්න බැහැ කියලා" ඒක තමයි නීති අංක එක. සෙක්ස් කරන්න ඕනෙ නම් පිට ගිහින් කරලා ගෙදරට එන්න ඕනේ, ඒකත් ඒ මනුස්සයා මුහුණට ම කිවුවා. ඇග්‍රිමෙන්ට් එකෙත් ඒක ලියලා තියෙනවා.

"එයාට පිස්සු"

මෙහෙම ගියොත් අද ම ඕකිට ඔතනින් යන්න වෙනවා.

"පව් මොනව වුණත් කෙල්ලෙක්නේ"

මගේ හිතට අනුකම්පාවක් ආවා.

"මොකක් හරි කරන්න ඕනේ" කොහොමත් මට අනුන්ගේ දේවල්වලට ඇඟිලි නොගහත් ඉන්න බැහැනේ.

මම ඉක්මනට ලියන මේසේට ගිහින් පෑනකුයි, කොළේකුයි අරගෙන මෙහෙම ලිවුවා.

"ලීනා, හිමිහිට, පහළට ඇහෙනවා"

එහෙම ලියලා එයාගේ කාමරේ දොරට තට්ටු කරලා ඒ කොළේ දොර යටින් කාමරේ ඇතුළට දැම්මා. මම ටිකක් වෙලා දොරට කන තියාගෙන අහගෙන හිටියා. මට ඇහුණා එයා හිමිහිට අඩිය තියාගෙන ඇවිත් කොළය අතට ගන්නවා.

මට කරන්න පුළුවන් දේ කළා. මම ආයෙමත් ආවා මගේ කාමරයේ දොර ළඟට. ඇවිත් දොර වහන්න ලෑස්ති වුණා. එතකොට මම දැක්කා ඒ කෙල්ල එයාගේ දොර අස්සෙන් ඔළුව ඔබලා බලනවා. ගොඩක් රුසියානු කෙල්ලන්ට වගේ ම එයාටත් තියෙන්නේ තඹ පාට කොණ්ඩයක්. ටිකක් කොටයි. නිල්පාට ඇස්. දොරෙන් පෙනුණේ එයාගේ ඔළුව විතරයි. එයා දැක්කා මම කාමරයේ දොර වහන්න යනවා. එයා මගේ දිහා බලලා,

"ස්තූතියි" කියලා රහසින් වගේ කිවුවා.

මමත් හිනාවෙලා දොර වහලා දැම්මා.

ඊට පස්සේ ඒ කෙල්ල මොනවා කළා ද දන්නේ නැහැ. හැබැයි කාමරයෙන් සද්දයක් නම් ආවේ නැහැ. අමාරුවෙන් හරි කට වහගෙන ඉවසගෙන කරගන්න ඇති, කරන්න දෙයක් නැහැ, ඉන්න තැන නැති කරගන්නවට වඩා ඒකත් එකක්.